අදහස අතඇරලා දැම්මා.

**මුලින්ම පත්තරේට ලිව්වේ මොනවද?**

මුලින්ම ලිව්වේ කවි. පළවෙනියටම මගේ කවි රචනයක් පළකෙරුණේ උඩකැන්දවෙල සරණංකර හාමුදුරුවන්ගේ 'නව ලෝකය' කියන සගරාවේ. ඒ කවි අධිරාජ්‍ය විරෝධය පදනම් කරගෙන ලියුව ඒවා. ඒකෙන් එකක් දෙකක් තාමත් මතකයි.

හිරිකිත නැතුව මහ පන්දම් අල්ලන්ට
හරියට වරේ දුන් ධනපති පල්ලන්ට
දිරිගතහොතින් අදිරද වැට හොල්ලන්ට
බැරිවෙන එකක් නෑ අපි වැනි කොල්ලන්ට

**කොහොමද මේ කවිකමට හිමිකම ඇතිවෙන්නේ?**

අපේ ළමා කාලයේ සමාජයේ කවිය බොහොම පැතිරිලා තිබුණා. ඒ කාලේ පත්තරවල පළ නොවුණ ආන්දෝලනාත්මක පුවත් සමාජයට ගියේ කවි කොල හරහා. හැම ගෙදරකම වගේ 'විදුර ජාතකය' වගේ බණ කවි පොත් තිබුණා. හුග දෙනෙක් තමන්ට පුළුවන් විදිහට කවි කිව්වා. කවි ලිව්වා. අපේ අම්මත් කවි ලිව්ව කෙනෙක්. ඒ පසුබිම නිසා කුඩා කාලේ ඉදලා මමත් කවි ලියන්න යොමු වුණා. වැලිගම ඉන්න කාලේ යාලුවන්ට කවි ඉගැන්නුවා. දවසක් මරදානේ මුද්‍රණාලයකින් මට කවි කොළයක් ලියන්න පැවරුවා. කවි කොළය කියලා නෙවෙයි කිව්වේ වෙන මොකක් හරි වචනයක්. මේක මට තේරුණේ කවි පොතක් ලියන්න කිව්වා කියලා. මම කවි පොතක් ලියලා ගෙනියලා දුන්නා. අපි කිව්වේ කවි පොතක් නෙවෙයි කවි කොළයක් කියලා ඒ අය කිව්වා. මම කවි පොත අරගෙන ගෙදර ආවා. පස්සේ කාලේ ඒක මුද්‍රණය කළා. ඒක තමයි 'නොනෙළු මළ'.

**එතකොට කවි කමෙන් නෙළුව මළ ?**

ග්‍රේස් වෙල්හෙල්මිනා කුරුකුල කරුණාතිලක දිසානායක ශ්‍රීමනී අනුලා වීරසූරිය තමයි නෙළුව මල. වැලිගම ඉන්න කාලේ එහෙ කවි හවුලක් තිබුණා. මමත් ඒකට සම්බන්ධවෙලා හිටියා. අනුලා ඒ කාලේ සිද්ධාර්ථ විද්‍යාලයේ ඉගෙන ගන්නවා. එයත් කවි හවුලේ හිටියා. කවි හවුලේ සගරාවට අපි කවි දෙබසක් ලිව්වා. මම 'සුළඟ'. අනුලා 'සුවඳ' මම කවියෙන් කිව්වා මලේ තියන සුවඳ මම බලෙන් අරගෙන යනවා කියලා. එයා ලියලා තිබුණා බලෙන් ගෙනියන්නේ ඇයි සුවඳ සුළඟත් එක්ක කැමැත්තෙන්ම එනවනේ කියලා. එතනින් අපේ යාලුකම ඇතිවෙලා පස්සේ කසාද බැන්දා.

**ඔබේ අනන්‍යතාව සටහන්වෙන්නේ දේශපාලන පත්තර කලාවේ. ඒකට විශේෂ හේතුවක් තිබුණද?**

මම ඉස්සෙල්ලාම බැදුණේ 'සිංහල ජාතිය' කියන පත්තරේට. ඒක දේශපාලන පත්තරයක්. මුලින් ඒ පත්තරය පියදාස සිරිසේන කරලා තිබුණේ. පස්සේ එයාගේ පුතා කරලා අසාර්ථකවෙලා නැවතිලා තිබුණා. හතලිස් හතේ හරි අටේ හරි මැතිවරණය තියන වෙලාවේ දෙහිවල ගල්කිස්ස ආසනේට තරග කළේ ගිල්බට් පෙරේරා. එයා මේ පත්තරේ අලුතෙන් පටන් ගත්තා. මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ගිල්බට් පෙරේරාට වැඩි සැළකිල්ලක් දැක්වුවේ නෑ. මේ නිසා ගිල්බට් පෙරේරා පක්ෂයත් එක්ක තරහ වුණා. තරහ වෙලා එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව යන්න තමයි 'සිංහල ජාතිය' පත්තරේ ආයෙම පටන්ගත්තේ. ඒ වෙලාවේ තමයි මමත් ඒකට සම්බන්ධ වෙන්නේ. ඊට පස්සේ 'දවස' පත්තරේට. 'දවස' ජාතික පත්තරයක් විදිහට තිබුණාට ඒක ඇතුළෙත් තදින්ම දේශපාලනය තිබුණා. ඒක ඉවසන්න බැරුව එතනින් අයින්වුණා. ඊට පස්සේ 'ඇත්ත'ට. ඒක සම්පූර්ණයෙන්ම දේශපාලන පත්තරයක්.

**'සිංහල ජාතිය' පත්තරෙන් 'දවස' පත්තරේට ගියේ ඇයි?**

සිංහල ජාතිය පත්තරේ ජනප්‍රිය වුණාම ගිල්බට් පෙරේරා ඉංග්‍රීසි පත්තරයක් පටන් අරගෙන ඒකට වාර්තාකාරයෝ ගත්තා. සිංහල පත්තරේට පරිවර්ථකයෝ ගත්තා. ඉංග්‍රීසි පත්තරේ පිටපත් පරිවර්ථනය කරලා සිංහල පත්තරේ දාන්න. ඒ නිසා රැස්වීම්වල සිංහලෙන් හාමුදුරුවරු එහෙම කරන වේගවත් කතා ඒ ආකාරයෙන්ම සිංහල පත්තරේ වාර්තා වෙන එක වැළකුණා. වැරදි වැඩිවුණා. දවසක් මම පරිවර්ථන ප්‍රවෘත්තියක් සබ් කරනකොට ඒකේ තියනවා නැවක තියන සගරා කාමරයක් ගැන. මම ඒකේ ඉංග්‍රීසි කොපිය බලනකොට ඒකේ තියෙන්නේ මෙගසින් රූම් කියලා. මෙගසින් කියන වචනයේ වෙඩිබෙහෙත් කියන තේරුමත් තියනවා. නැවක සගරා කාමරයක් තියෙන්න විදිහක් නැති නිසා මම ඒක හැදුවා වෙඩි බෙහෙත් කාමරය කියලා. ඔය වගේ වැරදි දේවල් තව කොච්චරවත් පළවුණා. අන්තිමේ පත්තර විකිනෙන එක පහළ වැටිලා පත්තර කන්තෝරුව වැහුණා. ඒ කාලේ තමයි 'දවස' පටන් ගත්තේ.

**'දවස' පත්තරෙන් 'ඇත්ත' පත්තරේට ගියේ?**

දවස පටන්ගන්න වෙලාවේ වාර්තාකරුවෙක් විදිහට ඒකට සම්බන්ධ වුණා. ටික කාලයකින් උප කර්තෘ කෙනෙක් විදිහට ගත්තා. දවසේ දිගටම හිටියේ උප කර්තෘ කෙනෙක් විදිහට. 'දවස' ජනප්‍රියවෙලා තියන කාලේ තමයි ඇන්.ඇම්. පෙරේරා ආණ්ඩුවට එකතුවෙලා මුදල් ඇමැති වුණේ. ගුණසේන කොම්පැණිය අයිතිකාරයෝ කැමතිවුණේ නෑ ආණ්ඩුවට මාක්ස්වාදියෙක් එකතුවෙනවට. ඔය අතරේ පාසල් පොත් නොමිලේ දෙන යෝජනාවකුත් ඇන්.ඇම්. ගෙනාවා. ඒ වෙනකොට පාසල් පොත් මුද්‍රණය සම්පූර්ණයෙන්ම තිබුණේ ගුණසේන එක අතේ. මේ නිසා ඒ වෙනකම් දවසේ තිබුණ යූඑන්පී විරෝධය බාල කෙරුණා. මේකට විරුද්ධව මමයි කර්තෘ මණ්ඩලේ තව අට දෙනෙකුයි දවසෙන් එළියට බැස්සා. එදාම තමයි 'ඇත්ත' පටන් අරගෙන තිබුණේ. මම 'ඇත්ත'ට ගියා.

**මේ බාහිර හේතු ඇරුණාම ඔබේ පත්තර ජීවිතය ගොඩනැගෙන්න බලපෑව අභ්‍යන්තරික හේතු තිබුණේ නැත්ද?**

පත්තරවලට එන්න කලින් ඉදළම මම අත්දැක්ක යම් යම් අසාදාරණයන්ට විරුද්ධව සටන් කිරීමේ පෙළඹවීමක් මා තුළ තිබුණා. ඒ අතර ප්‍රධාන එකක් මේ. අපේ තාත්තා පහතරට කරාව කුලේ. නමුත් මුහුදු ගියේ නෑ. වඩු වැඩ තමයි කළේ. තාත්තා තේ පෙට්ටි හදන්න නුවර පැත්තේ ගිහින් ඉන්න කාලේ තමයි කසාද බැදලා තියෙන්නේ. අම්මා උඩරට බෙරවා කුලේ. අම්මා ඉස්කෝලේ මොනිටර් විභාගේ පාස් වුණ කෙනෙක්. ඒ කාලේ මොනිටර් විභාගේ පාස් වුණාම ඉස්කෝලෙන්ම ගුරු පත්වීමක් ලැබෙනවා. අද වගේ දේශපාලනය ඕනේ කමක් තිබුණේ නෑ. නමුත් මොනිටර් විභාගේ පාස් වුණත් අම්මා අඩු කුලේ කියලා අම්මට ගුරු පත්වීම දීලා තිබුණේ නෑ. මේ අසාදාරණය පොඩි කාලෙම ඒ අයගේ කතා බහ අහලා මගේ හිතට තදින් වැදිලා තිබුණා. ඒ නිසා මට ඕනේ වුණා කුල භේදයට විරුද්ධව සටන් කරන්න. මම මහණ කරන්න හිටියේ. එහෙම වුණා නම් මහණවෙලා කුල භේදයට විරුද්ධව බණ කියනවා කියලා මම හිතාගෙන හිටියා.

පස්සේ වැලිගම ඉන්න කාලේ යාලුවන්ගේ ආශ්‍රයෙන් මාක්ස්වාදී පොත් කියවන්න ලැබුණා. පන්ති සටන දිනුවොත් කුල භේදය කොහොමත් නැතිවෙනවා කියලා හිතලා මම කොමියුනිස්ට් පක්ෂයේ අනුගාමිකයෙක් විදිහට ඒ කාලේදිම දේශපාලනයට නැඹුරු වුණා.

**අද නම් මාධ්‍යවේදීන් පැහැරගෙනයන එක,පහර-දෙන එක, අතුරුදහන් කරන එක, පත්තර කන්තෝරු ගිනි තියන එක අමුතු දේවල් නෙවෙයි. ඔබේ කාලයේ මේවගේ දේවල් ගැන තියන අත්දැකීම් මොනවද?**



මම ඇත්ත පත්තරේ විශේෂාංග පිටු බාරව කටයුතු කරන කාලේ දවසක් මාව පැහැරගෙන ගියා. ගාල්ල පැත්තේ අහිංසකයකුට ලොතරැයියකින් ඇදුන මෝටර් රථයක් ධනවත් පුද්ගලයකු වංචනිකව ඩැහැගත්ත ප්‍රවෘත්තියක් ඇත්තේ පළවුණා. ඒ ධනවත් පුද්ගලයා පත්තර කන්තෝරුව ළගට එයාගේ කාර් එකෙන්ම ඇවිල්ලා වැදගත් ප්‍රවෘත්තියක් දෙන්න තියනවා කියලා කාර් එකට නගින්න කිව්වා. මම නගින්වත් එක්කම කාර් එක ඇද්දා. කාර් එකේ තව දෙන්නෙක් හිටියා. බොරැල්ලේ කනත්තට ගෙනියලා මට ගහන්න තමයි මේ අය මාව අරගෙන ගියේ. මේ අයට ඕනේ වෙලා තිබුණේ ඇත්ත කර්තෘට ගහන්න. කර්තෘ මම කියලා වරද්දගෙන තමයි මාව අරගෙන ගිහින් තිබුණේ. ඒ බව දැනගත්තට පස්සේ මට බැනලා කනත්ත ළග දාල ගියා. 'ඇත්ත' කන්තෝරුවට ගිනි තැබීමක් සිද්ධ වුණා ඉන්දියන් හමුදාව ලංකාවට ආවට පස්සේ. ගිනි තියන්න ආව අය කිව්වේ ඒඅ ය ජේවීපී එකෙන් කියලා. ඇත්ත දේශ ද්‍රෝහී පත්තරයක් නිසා ගිනි තියනවා කියලා ගිනි තිබ්බා. ඊට කලින් ලංකාවේ පත්තර කන්තෝරුවක් ගිනි තියපු අවස්ථාවක් ගැන මම අහලා නෑ.

**මාධ්‍යවේදියා ජනතාවට ඉදිරියෙන් සිටිය යුතුයි කියලා කියනවා. අද බොහෝ මාධ්‍යවේදීන්ගේ භාවිතයන් දිහා බැලුවම පෙනෙන්නේ මේකේ අනෙක් පැත්ත. ඒ ගැන ඔබ මොකද හිතන්නේ?**

ධනවාදයට විරුද්ධව දෙයක් 'සිංහල ජාතිය' පත්තරේ ඇතළෙ කරන්න බෑ කියලා මම ඒකට බැදෙනකොට දන්නවා. නමුත් ධනවාදයට අවාසි යම් යම් දේ ඒක තුළ කරන්න පුළුවන්. මම ඒ දේ කළා. දැනුත් මාධ්‍යකරුවන්ට පුළුවන් වෙන්නේ තමන්ගේ සීමාව තුළ කළ හැකි දෙයක් කිරීම. නැතුව වෙනත් කෙනෙක් ආයෝජනය කරන පත්තරයක අපිට ඕනේ හැම දෙයක්ම කරන්න බැහැ. තමන්ට පත්තරයක් වෙනුවෙන් ආයෝජනයක් කරන්නත් බැහැ. එහෙම නම් අපිට වෙනවා කරන්න පුළුවන් දේ පමණක් කරලා සෑහීමකට පත්වෙන්න.


## Need Professional Help With Your Tax Returns & Accounts?

*Over 10 years experienced service for*

- Tax Returns (Individuals & Businesses)
- GST & BAS
- Bookkeeping (QuickBooks & MYOB)
- Financial Reports
- Company Incorporations
- Small Business Solutions

***FREE INITIAL CONSULTATION***



**Advance Accounting & Taxation Consultants**

**Amali Liyanage** *(M.Com, B.Sc, ASA) Registered Tax Agent*

*1/98,Plumpton Avenue, Glenroy,3046*

*advanceab@gmail.com 0433732854*